22/08/2010 - ඉරිදා ලංකාදීප

**අධ්‍යාපන විප්ලවය රටට වැඩදායක තරුණ පෙලක් බිහිකරයි - මිලින්ද මොරගොඩ**

අධ්‍යාපනය ලැබීමෙන් දරුවන් උසස් චරිත ලක්ෂණයෙන් හෙබි යහපත් පුරවැසියන් බවට පත්වෙයි. අධ්‍යාපනය ලැබීමේ අවසාන අරමුණ නොවිසේනම් එහි ඉලක්කය ස්වකීය අනාගතය සකස් කර ගැනීමයි. වෘත්තියක් කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම, එයින් පවුලට හා සමාජයට හොඳ ස්ථාවරයක් ගොඩනගා ගැනීම ඉලක්කයයි. පවුලේ දියුණුව හා සමාජ ප්‍රගමනයට ඒ නිසා අවස්ථාව ලැබේ.

පවුල කේන්ද්‍ර කරගෙන සංකල්පමය වශයෙන් අධ්‍යාපනයේ පදනම ඇතිවෙයි. සමාජ, සංස්කෘතික හා ආගමික වටිනාකම් එයට එකතු වෙයි. එකී මූලික අත්තිවාරම මත පාසල් අධ්‍යාපනයට අවස්ථාව ලැබේ. ආපසු හැරී බලනවිට අතීතයේ දී පාසල් අධ්‍යාපනයේ මූලික දර්ශනය ආගමික සිද්ධස්ථාන වටා සිදුවී ඇත. ලාංකික ඉතිහාසයේ ද අකුරු හැදෑරීම හා පොත පත අධ්‍යාපනය පැවතියේ පන්සල ආශ්‍රිතවය. අධිරාජ්‍යවාදී යුගයේ පවා පාසල් අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ කතෝලික හා ඇංග්ලිකන් පල්ලියයි. අධිරාජ්‍යවාදීන් විසින් ස්වදේශිකයන් මත ආගමික මතවාද පතුරවමින් අධ්‍යාපනය ලබා දෙන අවස්ථාවේ එයට විකල්ප වශයෙන් ගොඩනැගුනේ ද මියුසියස් හා ආනන්ද වැනි බෞද්ධ බලවේග අනුව බිහිවූ පාසල්ය. පසුව නිදහස් අධ්‍යාපනය දක්වා ව්‍යාප්ත වූ මෙරට අධ්‍යාපනය මිශ්‍ර එහෙත් කලාපයේ රටවල් සමග සසඳන විට ආඩම්බරවිය හැකි මට්ටමක් දක්වා වර්ධනය විය. අධ්‍යාපන ක්‍රමයේ අඩුපාඩු ඇත. නිසි අවස්ථාවේ දී ක්‍රමය නිවැරදි කරන්නට අපොහොසත් වීම නිසා අධ්‍යාපනය මත පමණක් බලාපොරොත්තු තබා එයින් පිටවන දරුවන් මේ රටේ දකුණේ පමණක් නොව උතුරේ ද ප්‍රධාන විප්ලවකාරී අවස්ථා තුනක් බිහිකරන්නට දායක වී ඇත. තරුණ අසහන කොමිසමක් පත් කිරීමෙන් පසුව එහි කරුණු දැක්වීම් අනුව අධ්‍යාපනයේ විෂමතා හා එහි නොගැලපෙන තැන් අනාවරණය කරගෙන ඇතත් අවසාන විසඳුමක් දෙන්නට අප තවමත් පොහෙසත්වී නැත.

පාසල්වලට ඇතුලුවන සිසුන් අතරින් විශ්ව විද්‍යාල අධ්‍යාපනයට සුදුසුකම් ලබන්නේ සියයට හතක පමණ පිරිසක් පමණකි. දෙමාපියන් මහත් උනන්දුවෙන් පාසලට දරුවන් ඇතුලත් කරන අතර ඒ දරුවන් ගේ අධ්‍යාපනය වෙනුවෙන් රජය වැය කරන ධනස්කන්ධය අති විශාලය. එහෙත් අවසානයේ සිසුන් සියයකගෙන් අනු තුන් දෙනෙකුට විශ්ව විද්‍යාලයට ඇතුල් වන්නට අවස්ථාව නොලැබේ. විශ්ව විද්‍යාලයකට ඇතුල් වී උසස් අධ්‍යාපනයක් ලබන්නට ලංකාවේ ඇති අවස්ථාව කොතරම් විරල එකක් ද යන්න මෙයින් වටහා ගත හැකිය.

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතා බ්‍රිතාන්‍යයේ හයවන ජෝර්ජ් රජුගේ නියමයෙන් මෙරටට පැමිණ නිදහස ලබන ලංකාවට ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ කාර්ය භාරය ඉටු කළේය. පසුව පේරාදෙණිය විශ්ව විද්‍යාලය ආරම්භ කරමින් එහි දර්ශනය හා විද්වතුන් සැරිසරන අධ්‍යාපනික පරිසරය නිර්මාණය කළේය. විශ්ව විද්‍යාලයකින් බිහිවිය යුත්තේ පරිපූර්ණ විද්‍යාර්ථීන්බව මෙරට උසස් අධ්‍යාපනය ආරම්භ කරන අවස්ථාවේ අවධානය යොමු කරන ලද ප්‍රමුඛ කාරණයක් බවට සැකයක් නැත. කාලානුරූපව විශ්ව විද්‍යාල පද්ධතිය ප්‍රසාරණය වී තිබේ. අධ්‍යාපන රටාව වෙනස් වී ඇත. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා නිදහස් අධ්‍යාපන ක්‍රමය ඇති කළේය. එයින් පසු කැපීපෙනෙන අන්දමට ජාත්‍යන්තරයේ අධ්‍යාපනයේ පසුබිම වෙනස් විය. අපේ විශ්ව විද්‍යාලය නුම සොයා යන බුද්ධිය ගවේශනය කරන කේන්ද්‍රස්ථානයක් බවට පත්ව තිබේද?

විශ්ව විද්‍යාලයකට ප්‍රවේශවීම උග්‍ර තරගකාරී අවස්ථාවක එහි පැමිණෙන සිසුන් තම අධ්‍යාපනය උදෙසා සම්පූර්ණ අවධානය යොමු කළ යුතුය. එහෙත් වර්තමානයේ විශ්ව විද්‍යාල තුළ ඇත්තේ දේශපාලනයයි. මෙය ක්‍රමයෙන් ආරම්භවී අද තත්ත්වය දක්වා උග්‍ර වී ඇත. අද විශ්ව විද්‍යාල තරුණන් සමාජයේ ආදරයට ලක්වූවන් නොවේ. ඔවුහු මිනී මරා ගනිති. අනවශ්‍ය ලෙස නවක වදය පතුරවා විශ්ව විද්‍යාලය අපකීර්තිමත් තැනක් කරති. දේශපාලන

ප්‍රශ්න අතට ගෙන පෝස්ටර්, පිකටිං හා විරෝධතා පවත්වති. ආචාර්යවරුන් හා පාලක මණ්ඩලය සමග ආරවුල් ඇති කර ගනිති. දිවයින පුරා පිහිටි විශ්ව විද්‍යාල පද්ධතිය අවට ජීවත්වන කිසිවෙකු සිසුන්ගේ ක්‍රියාපටිපාටීන් ගැන කැමැත්තක් නැත. ඔවුන්ගේ හැසිරීම නිසා අසල්වාසීන් සමග ද, ඔවුනොවුන් අතර ද නිතර ගැටුම් ඇති කර ගනී. මේවා අවසන් වෙන්නේ අවාසනාවන්ත ලෙස දින නියමයක් නොමැතිව විශ්ව විද්‍යාල වසා දමමින්ය.

විශ්ව විද්‍යාලයට පැමිණෙන්නේ යමක් තේරුම්ගත හැකි වයසේ පිරිසකි. ඔවුන් මේ රටේ ප්‍රශ්න වලින් සහමුලින්ම හුදෙකලා වී සිටිය යුතු නැත. ඔවුන්ට දේශපාලනයක් තිබිය හැකිය. රට පාලනය කරන අන්දම, ප්‍රජාතන්ත්‍රවාදය ගමන් කරන දිසාව හෝ දේශපාලන පක්ෂ වල ප්‍රතිපත්ති ගැන විවිධ එකිනෙකට වෙනස් ආකල්ප තිබිය හැකිය. මේ අදහස් ඉදිරිපත් විය යුත්තේ බුද්ධිමත් සංවාද වශයෙනි. සිසුන්ට දේශපාලනය කිරීමේ හා දේශපාලන පක්ෂයක් වෙනුවෙන් පෙනී සිටීමේ අයිතියක් ඇත. එහෙත් එහි යම් සීමාවක් තිබිය යුතුවෙයි. මේ සීමාව ඉක්මවා යන විට සමාජයට එය ප්‍රශ්නයක් වෙන්නට පටන් ගනී.

ආපසු හැරී බලන විට අතීතයේ විශ්ව විද්‍යාල තරුණයන් ගේ ස්වභාවය කෙබඳුද? පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පළමු ශිෂ්‍ය කණ්ඩායමටත් අරගල තිබිණ. ඔවුහු එවකට තිබුණ ගැටලුවක් අරභයා ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ නිවෙස වටලා තිබේ. බැරෑරුම් අන්දමට කරුණු ඉදිරිපත් කරන සිසුන්ගෙන් මෙය නීති විරෝධී කාර්යයක් බව ඔබ දන්නවාදැයි ප්‍රශ්න කළ හෙතෙම තේ කෝප්පයක් බොන්නට ජෙනින්ග්ස් මහතා ඇරයුම් කර ඇත. කෝපි පානය කළ සිසුන් සාකච්ඡාව අතරතුර යථාර්ථය වටහාගෙන තිබේ. ගැටලු නිරාකරණය කරගෙන ඇත. දශක හයකට පසු සමාජය ප්‍රශ්න විසඳාගන්නා අන්දම දියුණු වී ඇති නමුත් විශ්ව විද්‍යාලයේ ප්‍රශ්න විසඳා ගන්නා අන්දම ගමන් කර ඇත්තේ කොයිබටද? විශ්ව විද්‍යාලයේ ප්‍රශ්න එයින් පිටට ගෙනැවිත් සමාජයේ අනාවරණය කරන අතර ඒවාට උත්තර සොයන්නේ කණ්ඩායම් වශයෙන් එකතුවී ජාතික දේපොල විනාශ කරමින්, මහජනතාව අතර පුගුප්සාවට ලක්වෙමින් හා ජීවිත හානිකර ගනිමින් වීම කොතරම් ඛේදජනකද?

මෙයට හේතුව කුමක්ද? අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු වුවත් තමන්ට අනාගතයක් නැතැයි සිතන තරමට ලාංකික ශිෂ්‍ය ප්‍රජාව පත්ව සිටීම එයට බලපා ඇති කාරණයයි.

සම්ප්‍රදාය අනුව ඉගෙන ගන්නට පෙළැඹෙයි. හැම දෙනෙකුගේම අරමුණ විශ්ව විද්‍යාලයයි. විශ්ව විද්‍යාලයෙන් පසු රජයේ හෝ පුද්ගලික අංශයේ රැකියාවක් අපේක්ෂාවයි. මෙරට පවතින ආර්ථික සා සමාජ වාතාවරණය අනුව විශ්ව විද්‍යාලයෙන් පිටවන තරුණයෙකුට කුමක් හෝ රැකියාවක් තිබිය යුතුය. එසේ නමුත් උපාධිය ලැබීම යනු අනිවාර්යයෙන් රැකියාවක් හිමිවන කඩඉමක් වශයෙන් සලකන රටක් ලෝකයේ නැත. බුද්ධිමත් හා දැනුමෙන් වැඩිවන තරුණයෙකු තම දැනුම යොදවා නිෂ්පාදනයක හෝ සේවාවක යෙදිය යුතුය. ආදායමක් ලැබෙන්නේ එයටය. ලංකාවේ කෙරෙන්නේ බුද්ධිමත් තරුණයන් රැකියා ඉල්ලා කැරළි ගැසීමයි. මේ රැකියාව ඉල්ලන්නේ ආණ්ඩුවෙන්ය. උද්ඝෝෂණ හා විරෝධතා වලින් මෙල්ලවන ආණ්ඩු කරන්නේ මේ උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමයි.

එහෙත් දැන් ප්‍රවනතාව අනුව ලෝකයේ බොහෝ රටවල ආණ්ඩුවේ රැකියා කිරීම අඩු අවධානයට ලක්වන හේතුවකි. ආණ්ඩුවේ වැටුප් ගෙන ජීවත්වීම මදිකමකි. එයට හොඳම උදාහරණය ප්‍රශ්න සපයන්නේ ඇමරිකාවේ ජෙනරල් මෝටර්ස් ආයතනයයි. ආර්තික අර්බුදය හමුවේ ඇමරිකානු රජය මෙම ආයතනයේ කොටස් රජයට පවරා ගත් අතර වසර දෙකකට පසු එහි කොටස් නැවත පුද්ගලික අංශයට විකුණන්නට ඔබාමා පාලනය යෝජනා කර තිබේ. ලංකාවේ නම් එයට විරුද්ධව උද්ඝෝෂණය කරනු ඇත. එහෙත් වත්මන් ජෙනරල් මෝටර්ස් සේවකයෝ එම යෝජනාව කඩිනම් කරන ලෙස පාලකයන්ගෙන් ඉල්ලා තිබේ. එයට හේතුව රජයේ අරමුදල් වලින් යැපෙන්නන් වශයෙන් සමාජයේ පෙනී සිටීමට ඇති අකමැත්තයි.

මෙරට රාජ්‍ය සේවය විශාලය. රජයේ සේවයට වැටුප් ගෙවන්නේ මහජනතාවගෙන් අයකර ගන්නා බදු මුදල් වලිනි. තව තවත් රාජ්‍ය සේවය විශාල වන විට මහජනතාවට එය වෙනුවෙන් තව තවත් බදු ගෙවන්නට සිදුවෙයි. පුද්ගලික අංශය මෙරට උපාධිධාරීන් ගැන උනන්දුවක් නැත. මේ ඇයි ද යන ප්‍රශ්නයට ද පිළිතුරු දිය යුතුය. පෞද්ගලික සමාගම් ක්‍රියා කරන්නේ ලාභ අරමුණු කරගෙනය. වෙළඳපොළ තරගකාරීත්වයට මුහුණ දෙන්නට හැකියාව ඇති ශ්‍රමය විනා සමාගමෙන් නඩත්තුවන සේවකයන් කෙරෙහි ඔවුහු උනන්දු නොවෙති. තරගකාරී ලෙස ව්‍යාපාර කරන්නට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා දැනුම විශ්ව විද්‍යාල උපාධිධාරීන් අතර අඩුය. වෙළඳපොල හැසිරීම අනුව කැපවීමෙන් වැඩ කරන්නට ඔවුන්ගේ ආකල්ප සැකසී නැත. ඒ නිසා නිතර වෘත්තීය අයිතිවාසිකම් හා නීති ප්‍රශ්න ඇති කරනු ඇතැයි විශ්ව විද්‍යාල තරුණන් කෙරෙහි සැක කරයි. උපාධිය නැතත් කොළඹ පාසලක, ඉංග්‍රීසි දැනුම ඇති අලුත් ආකල්ප වලින් සමන්විත තරුණන්ට රැකියා ලැබෙන හා උපාධිධාරීන් රැකියා විරහිතව උද්ඝෝෂණ කිරීමේ රහස එයයි.

දෙමාපියන් මේ තත්ත්වය දනී. ඉතාමත් මහන්සිවී ජාතික පාසලකට දරුවා ඇතුලත් කර උපාධියක් ගැනීමෙන් පසු කඳුලු ගෑස් පහර මැද විරෝධතාවලට තම දරුවා සම්බන්ධවනවා දකින්නට කැමති දෙමව්පියන් මේ රටේ නැත. විශාල මුදලක් වැය කර නිදහස් අධ්‍යාපනය දී අනාගතය පෑදූ දරුවන්ට පහර දී පන්නා දමන්නට ආණ්ඩු තීරණය කරන්නේ ද කැමැත්තකින් නොවේ.  එහෙත් යථාර්ථය මෙයයි. මේ දන්නා සත්‍යය වෙනස් කරන්නට සමාජය උනන්දු නොවන්නේ මන්ද? කාලයට ගැලපෙන අන්දමට ආකල්ප හා දැනුම අතින් වෙනස් අධ්‍යාපන රටාවක් ඇතිවිය යුතු බව සමාජයේ සියලු දෙනා පිළිගන්නා නමුත් ඒ වෙනස ඇති කරන තීන්දු ගන්නට අප සූදානම් නැත. එයට හේතුව මේ ක්‍රමය වෙනස් කරන්නට යාමේ දී විරුද්ධත්වය ඇති වනවාට ඇති බියයි. ඒ වෙනස් වීම නිසා තමන්ගේ දේශපාලනයට හා බලයට හානිවිය හැකි නිසා ආණ්ඩු කරන්නේ ක්‍රමය පවත්වාගෙන යාම හා ක්‍රමයට අභියෝග එන විට එය මර්දනය කිරීමයි.

දරුවන්ට අධ්‍යාපනය ලබා දීම තමන්ගේ අනිවාර්ය අංගයක් ලෙස දකින ආණ්ඩු වලින් මේ ප්‍රශ්න විසඳාගත නොහැකිය. මූලික අධ්‍යාපනය රජයේ වගකීමක් හා යුතුකමක් විය හැකිය. ඉන්පසු වෘත්තීය අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනයට අවස්ථා බහුල විය යුතු අතර සුදුසු ස්ථාන වලට දරුවන්ගේ කෞශල්‍ය හා සහජ දක්ෂතා අනුව යොමු කරන වැඩ පිළිවෙලක් රටට තිබිය යුතුය. එය කළ හැක්කේ රජය හා පුද්ගලික අංශ අතර තරගකාරීත්වයක් ඇති කිරීමෙන් පමණකි. බටහිර රටවල පමණක් නොව ඉන්දියාවේ විශ්ව විද්‍යාලවලට පවා සිසුන් තෝරා ගන්නේ දක්ෂතාවය අනුවය. එහි ඇති පාඨමාලා සඳහා සිසුන් තොරා ගැනීමෙන් පසු ඒවාට මුදල් ගෙවිය හැකි සිසුන් හඳුනා ගන්නා අතර ආර්ථික අපහසුතා සහිත දරුවන්ට ශිෂ්‍යත්ව පිරිනමයි. සමාන අවස්ථාව ඇත්තේ නිසි අධ්‍යාපනය ලැබීමටය. මොනවා හෝ දෙයක් ඉගෙන ගෙන පසුව උද්ඝෝෂකයන් වන්නට නොවේ. වර්තමානයේ ලෝකයේ උසස් අධ්‍යාපන ආයතන අතරින් සියයට හැත්තෑවකට වඩා පාලනය අයත් පුද්ගලික අංශයටය. හාවඩ්, යේල්, කේම්බ්‍රිජ්, ඔක්ස්ෆඩ්  වැනි ප්‍රමුඛ ආයතන නිර්මාණය වී ඇත්තේ එසේය. ධනවතුන් හා රජයේ අරමුදල් මගින් මේවා ලාභ නොලබන ආයතන ලෙස නඩත්තු වන අතර එයින් අධ්‍යාපනයට සේවයකි සිදුවෙයි.

අපට සම්ප්‍රදායික අධ්‍යාපන රටාවක් තිබුණි. එහි උරුමය ආගමික සිද්ධස්ථානයයි. යටත් විජිත ආක්‍රමණ සමග රටට මිශනාරී අධ්‍යාපනය එකතු වූ අතර එහි ඇති ලක්ෂණ රටට මිශ්‍ර වී තිබේ. රාජ්‍ය හා පෞද්ගලික අධ්‍යාපනය සම්බන්ධව ද ඇත්තේ එකිනෙකට වෙනස් ආකල්පයන්ය. නොමිලේ අධ්‍යාපනය ලැබිය යුතු බව සිතන නමුත් නොමිලේ අධ්‍යාපනය ප්‍රමාණවත් නැති හෙයින් මුදල් ගෙවා ටියුෂන් යැවීම ට දෙමාපියන් පෙළැඹී සිටී. මූලික අධ්‍යාපනයේ පටන් උසස් පෙළ දක්වා නොමිලේ අධ්‍යාපනයට සමාන්තරව පුද්ගලික පන්ති හා පෞද්ගලික පාසල් පද්ධති පැවැත්වෙයි. පෞද්ගලික පාසල් ලාභ උපයන හා ලාභ ඉපැයීමකින් තොරව කළමනාකරණය වශයෙන් අංශ දෙකක් ඇති බව ද පෙනේ. මුදල් ඇති සමාජය රටින් පිට ගොස් අති විශාල මුදලක් වැය කර විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබයි.

ලාංකික දරුවන්ට ඉතිරිව ඇත්තේ රජයේ විශ්ව විද්‍යාල හා එයින් පිටවන විට රැකියා ඉල්ලා සටන් වදින ක්‍රමය පමණකි. පවතින නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කර ගත යුතුය යන මතය දක්වමින් සටන් කරන පුද්ගලයන්ගේ දරු ප්‍රිරියන් ද අධ්‍යාපනය ලබන්නේ විදේශ රටකය. විදේශ රටවල විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා පැමිණෙන පිරිස මෙරට රැකියා විරහිත පෝලිමට එකතු වී නැත. භාෂා දැනුම හා ප්‍රායෝගික අධ්‍යාපනය නිසා එකී පිරිස අධ්‍යාපනයෙන් පසු තම වෘත්තිය තෝරා ගන්නට හැකි දැනුම ලබා ඇත. පවතින ක්‍රමය වෙනස් කිරීමට විරුද්ධ පිරිස මේවා ප්‍රශ්න නොකරන්නේ ඇයි,

යථාර්ථය අවබෝධ කර ගත යුතුය. අධ්‍යාපනය බිඳ වැටී ඇති අතර එහි නිදහස් අධ්‍යාපනය යන සංකල්පයක් නැති බව තේරුම් ගත යුතුය. කෙලින්ම සාකච්ඡා කර රජය හා පුද්ගලික අංශය අතර සම්බන්ධතාවයක් ගොඩනගා රටට අවශ්‍ය බුද්ධිමත් ශ්‍රමය බිහි කරන නව ක්‍රමවේදයක් ඇති කිරීම අවශ්‍යය. සාම්ප්‍රදායික උසස් අධ්‍යාපනය හා එයින් පසු විශ්ව විද්‍යාලය යන ක්‍රමවේදයෙන් බැහැරව කාර්මික හා තාක්ෂණික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණු අවස්ථා වැඩි කළ යුතුය. හැම තරුණයෙකුම උපාධිධරයෙකු වීම අවශ්‍ය නැත. ලෝක ප්‍රකට මයික්‍රොසොෆ්ට් සමාගමේ අධිපති බිල් ගේට්ස් මහතා විශ්ව විද්‍යාල අධ්‍යාපනය අතහැර තමන්ම තාක්ෂණික අධ්‍යාපනය හදාරා ව්‍යාපාරයක් අරඹා වෙළඳපොළ ජයගත් පුද්ගලයෙකි. ඔහු උපාධිය ගත්තානම් අද ලෝකය ඔහු හඳුන්වන්නේ උපාධිධරයෙක් වශයෙන් පමණකි. ලෝක සමාජය පරිවර්තනය වන විට කර්මාන්ත යුගයෙන් පසු තමන්ගේ දෑත් පිරිසිදුව තබාගෙන ටයිපටි පැළඳ කරන රැකියා උසස් යැයි සම්මතයක් පැවතින. අද ඒ යුගය අවසන්ව තිබේ. එහෙත් ආකල්ප හා හැසිරීම අතින් අපේ සමාජයේ වැඩි දෙනෙක් තවමත් ගරු කරන්නේ එකී පැරණි ආකල්පයන්ටය. ශ්‍රමයට ගරු කරන බුද්ධියට තැනක් ඇති සමාජයක් අද බිහිවී තිබෙන බව තේරුම් ගත යුතුව තිබේ. උපාධිය රැකියා වෙළඳ පොළට අවශ්‍ය පරිදි සැකසීම සේ ම එකිනෙකාගේ හසුරුකෞශල්‍ය අනුව අධ්‍යාපනය ලබන දරුවන් ගේ දැනුම බුද්ධිය වැඩි කරන ක්‍රමවේදයක් ඇති කිරීම වැදගත්ය. සමාජය ඒ වෙනුවෙන් පෙරමුණ ගත යුතුය. පවතින ක්‍රමය වෙනස් කරන ලෙස බලධාරීන්ට බල කළ යුතුය.

මෙයට අමතරව ජාත්‍යන්තරයේ සිදුවෙමින් පවතින වෙනස්කම් ගැන ද අවධානය යොමු කළ යුතුය. තොරතුරු තාක්ෂණයේ දියුණුව නිසා ලොව පිළිගත් විශ්ව විද්‍යාල වල අධ්‍යයන තොරතුරු වෙබ් අඩවි වලින් දැක ගත හැකිය. මේවා හැදෑරීමට පමණක් නොව නුදුරු කාලයේ දී මේ ලොව ප්‍රධාන විශ්ව විද්‍යාල වල විභාග වලට භූගෝලීය සාධක නොතකා ඉදිරිපත්වන්නට ද එයින් උපාධි ලබන්නට ද හැකිවනු ඇත. ඒ කාලය වැඩි ඈතක නොවේ. එවැනි අවස්ථාවක මෙරට විශ්ව විද්‍යාල පද්ධතියට සිදුවන්නේ කුමක්ද? දෙවනුව ලිනට ලෝකයේ පැතිර යමින් පවතින ප්‍රවණතාව අනුව උසස් අධ්‍යාපනයට වැඩි වශයෙන් සුදුසුකම් ලබන්නේ කාන්තාවන්ය. ලංකාවේ ද එය සිදුවෙමින් පවතී. පවුලේ බර දරන හා සාමාජයීය වශයෙන් පුලුල් කාර්ය භාරයක නිරත කාන්තාවන්ට මෙවැනි අවස්ථාවන් හිමි වීම කාන්තා සංවිධාන අවධානයට ලක්ව පවතින අධ්‍යාපන රටාව ප්‍රතිශෝධනය කෙරෙහි සැලකිල්ලක් දැක්වීම වටී.